# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2122/39 – 2019 මැයි 09 වැනි බ්‍රහස්පතින්දා – 2019.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/205.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. නිශාන්තප්‍රිය මයා, අංක 204/29/8, රත්නගිරි වත්ත, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

1A – G30034 – 21 (2019/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/205.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. නිශාන්තප්‍රිය මයා, අංක 204/29/8, රත්නගිරි වත්ත, හිරණ, පානදුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධි ශ්‍රේණියේ ලිපිකරුවෙකු වූ ඒ. එම්. නිශාන්තප්‍රිය මහතාට 2014.08.01 දින සිට හා නැවත 2016.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවස්ථා දෙකකදී ලබාදුන් වැටුප් සංශෝධනය පසුව අවලංගු කිරීම යුක්තිසහගතද? එසේ නොවන්නේ නම් ඒ මහතාට හිමිවිය යුතු වෙනත් සහනයක් ඇත්ද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-580

---

මගේ අංකය: IR/COM//04/2018/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. ඩී. සෝමසිරි මයා, අංක 13, පරමාඋල්ල, අලව්ව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, අංක 570/බී/1, පී. නවරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2018/29.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

පී. ඩී. සෝමසිරි මයා, අංක 13, පරමාඋල්ල, අලව්ව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුල පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් වෙන්නප්පුව ඩිපෝවේ සේවය කරමින් සිටි පී. ඩී. සෝමසිරි මයා 2014.10.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් නොගෙවා වයස අවුරුදු 55 න් විශ්‍රාම ගැන්වීම මගින් ඔහුට යම් අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-581

මගේ අංකය: IR/COM/05/2018/150.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යමුනා විනෝදනී ද අල්විස් මිය, අංක 275/1, පරණ නුවර පාර, දළුගම, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මහනුවර, හෙද පුහුණු පාසල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/150.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යමුනා විනෝදනී ද අල්විස් මිය, අංක 275/1, පරණ නුවර පාර, දළුගම, කැළණිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහකාර අධ්‍යක්ෂක (සංගීත) ලෙස කටයුතු කර ඇති යමුනා විනෝදනී ද අල්විස් මහත්මියට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 අනුව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි MM 1-1 වැටුප් පරිමාණයේ කාණ්ඩගත කර වැටුප සංශෝධනය කළ ද, හිඟ වැටුප්, දීමනා හා අනෙකුත් හිමිකම් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

05-582

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.